# ඡන්දදායකයන්ට වැඩිම බලපෑමක් සිදුවුණේ සමාජ මාධ්‍යයෙන්

06/08/2020

පසුගිය වසර දහයක මැතිවරණ සමග සසඳා බැලීමේදී මෙවර පැවැති පාර්ලිමේන්තු මැතිවරණය ඉතාමත් සාමකාමී බවත්, ෆේස්බුක් වැනි සමාජ ජාලා ඔස්සේ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් මෙවර වැඩිපුර සිදුවී ඇති බවත් පැෆරල් සංවිධානය කීවේය.

එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි පවසන්නේ මැතිවරණ නිහඬ කාලය තුළ පමණක් ෆේස්බුක් සමාජ ජාලා යොදාගෙන සිදුකර ඇති මැතිවරණ ප්‍රචාරණ කටයුතු ගණන 4400ක් බවයි.

මෙවර මැතිවරණයේදී ඡන්ද දායකයන්ට වැඩිම බලපෑමක් සිදුවී ඇත්තේ සමාජ මාධ්‍ය මගින් බවත්, අපේක්ෂකයන් මැතිවරණ නීති උල්ලංඝනය කරමින් එම මාධ්‍ය ජාලා භාවිත කර ඇති බවත් ඔහු කීවේය.

රෝහණ හෙට්ටිආරච්චි මහතා මේ බව පැවැසුවේ ඊයේ (5 වැනිදා) පැෆරල් සංවිධානය කොළඹදී පැවැත්වූ මාධ්‍ය හමුවකදීය.

මැතිවරණ සම්බන්ධයෙන් ඊයේ (5 වැනිදා) සිද්ධි 143ක් වාර්තා වී ඇති බවත් ඊට සමාජ මාධ්‍ය යොදා ගනිමින් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදුකිරීමේ සිද්ධීන් 510ක්ද වාර්තා වී ඇති බවත් හෙතෙම කීවේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ හෙතෙම මෙලෙස පැවැසීය.

'මැතිවරණ දිනයේදී පහරදීමේ සිද්ධියක් මහියංගන බෙලිගල්ල ප්‍රදේශයෙන් වාර්තා වෙලා තියෙනවා. ඒ ප්‍රදේශයෙන් පුද්ගලයකුව අත්අඩංගුවට අරගෙන තියෙනවා. මීට අමතරව මහනුවර කුණ්ඩසාල ප්‍රදේශයේදී තර්ජනය කිරීමකුත් වාර්තා වෙලා තියෙනවා.

ගිනි අවි යොදාගෙන ඡන්දය ආයාචනා කිරීමේ සිද්ධීන් තිස්තුනක් ප්‍රදේශ ගණනාවකින් අපට වාර්තා වෙලා තියෙනවා. මැතිවරණ දිනයේ අවසන් පැය කිහිපය තුළ රථ පෙළපාළි දෙකක් පිළිබඳව වාර්තා වුණා. ඒ කුරුණෑගල, නිකවැරටිය සහ අම්පාර අක්කරෙයිපත්තුව ප්‍රදේශයෙන්. ඒ වගේම හොර ඡන්ද දැමීමේ සිද්ධි පහළොවක් වාර්තා වෙලා තියෙනවා. ඡන්දදායකයන් ප්‍රවාහනය කිරීමේ සිද්ධි පහක් වාර්තා වෙලා තියෙනවා.

කොවිඩ් 19 නිසා නිරෝධායන මධ්‍යස්ථානවල සිටින පුද්ගලයන්ට ඡන්දය භාවිත කිරීමට හැකියාවක් ලැබුණේ නැත. මැතිවරණ කොමිසම මේ සඳහා උපරිම උත්සාහයක් දැරුවත්, ඒ සඳහා අවශ්‍ය නීතිවල අඩුපාඩුවක් තිබුණා. ඒ නිසා ඔවුන්ට ඒ අවස්ථාව ලැබුණේ නැහැ. මේ රටේ සෑම පුරවැසියකුටම ඡන්දය ලබාදීමට අවශ්‍ය නීතිමය සංශෝධන ඉදිරියේදී අවශ්‍යයි. දහස් ගණනක් ඡන්දදායකයන්ට මෙවර ඡන්දය ලබාදෙන්න බැරිවුණා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන්, ආරක්ෂක අංශ, පෞද්ගලික අංශ නිලධාරීන්, මැතිවරණ නිරීක්ෂකයන්, බන්ධනාගාරගත වෙලා ඉන්න පිරිස්වලට ඒ අවස්ථාව අහිමි වුණා. අපි යෝජනා කරනවා නව පාර්ලිමේන්තුවේ මේවාට අවශ්‍ය නීති සම්පාදනය කරන්න කියලා.

කොවිඩ් 19 තත්ත්වය නිසා මෙවර මැතිවරණයේදී සාම්ප්‍රදායික ප්‍රචාරණ කටයුතුවල යෙදුණේ නෑ. ආර්ථික හැකියාව වැඩි අයට තමයි මෙවර මැතිවරණයේදී මැතිවරණ ප්‍රචාරණ කටයුතු කරන්න පුළුවන් වුණේ. මෙතැන සමවීමක් තිබුණේ නැහැ. ඉදිරි පාර්ලිමේන්තුවේදී ඒ ගැන කටයුතු කරන්නත් අවශ්‍යයි.

දින දෙකකින් මැතිවරණ ප්‍රතිඵල නිකුත් වුණාට පසුව ජයග්‍රාහී කණ්ඩායම්වලට අපි කියන්නේ ඔබේ ජයග්‍රහණ අනිකුත් කණ්ඩායම්වලට මානසික හෝ ශාරීරික පීඩනයක් ඇති කර දෙන එකක් කරගන්න එපා කියලා. ජයග්‍රහණය සාමකාමීව භුක්ති විඳින්න. තව සති දෙකක් යනතුරු පාක්ෂිකයන් එක්රැස් කරමින් විවිධ උත්සව සංවිධානය කරන්න එපා. අපේ සංවිධානය ඉදිරි සති දෙකක කාලයේදී අඛණ්ඩව නිරීක්ෂණ කටයුතු කරනවා.

කුරුණෑගල නිකවැරටිය ප්‍රදේශයේදී ප්‍රධාන අපේක්ෂකයෝ දෙදෙනකු විශාල කණ්ඩායමක් සමගින් රථ වාහන 20-25ක් යොදාගෙන සිදුකළ පෙළපාළියෙන් එම ප්‍රදේශයේ මහජනතාවට සිදුවූ බලපෑම පිළිබඳව කනගාටු වන බවත්, අපේක්ෂකයන් ලෙස ඔවුන්ට ඡන්දය භාවිත කිරීමට ඡන්ද මධ්‍යස්ථානයට පැමිණීමට හැකියාව තිබුණත්, ඡන්ද දායකයන් ඒකරාශී කිරීමේ හැකියාවක් ඔවුනට මැතිවරණ නීතිය යටතේ හෝ නිරෝධායන නීතියක් යටතේ නොමැති බවත් හෙතෙම වැඩිදුරටත් පැවසීය. නිකවැරටිය ප්‍රදේශයේ මහසෙන් විද්‍යාලයේ සහ විතිකුලිය විද්‍යාලයේ පැවැති ඡන්ද මධ්‍යස්ථාන දෙක ආශ්‍රිතව මෙම රථ පෙළපාළිය ගමන් කර ඇති බව රෝහණ හෙට්ටිආරච්චි මහතා කීවේය. අම්පාර අක්කරෙයිපත්තුව ප්‍රදේශයේද මෙවැනි රථවාහන පෙළපාළියක් පැවැති බවට වාර්තා වී ඇතැයිද හෙතෙම කීවේය.

කුරුණෑගල ප්‍රදේශයේ ඡන්දය නැවත වරක් පැවැත්විය යුතු බවට රාවයක් පැවතියත් සමස්ත මැතිවරණයට මෙම සිදුවීමෙන් සෘජු බලපෑමක් වී නොමැති බැවින් මැතිවරණ කොමිසම ඒ පිළිබඳව කිසිවක් ප්‍රකාශ කර නොමැති බව හෙතෙම අවධාරණය කළේය.

නිකවැරටියේ රථ පෙළපාළි දෙකක්

පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

© 2019 All Rights Reserved. Powered by *Summit (http://www.summitindia.com)*